# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | 8 ඒකකය |
|---|---|---|

## ආයෝජනය

### I - කොටස

- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. නිවැරදි ගැළපීම් තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (i). | භාණ්ඩාගාර බිල්පත් | A. | ප්‍රාග්ධන ලාභ ඉපයිය හැක |
| (ii). | ස්ථාවර තැන්පතු | B. | අමතර ප්‍රතිලාභ හිමි වේ |
| (iii). | ඉතිරි කිරීමේ ගිණුම් | C. | පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් හිමිවීම |
| (iv). | දේපළ මිලදී ගැනීම් | D. | ඉහළ පොළී අනුපාතයක් ලැබේ |

(1). ABCD (2). CDAB (3). DCAB (4). CDBA

(ල.02)

02. හිස්තැන් සඳහා වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(ලාභාංශ, සාමාන්‍ය කොටස්, ප්‍රාග්ධන ලාභ, කොටස්, ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව, ශ්‍රී ලංකා මහ බැංකුව)

(1). ........................................................... මිලදී ගන්නා ආයෝජකයන්ට සමාගමේ හිමිකම ලැබේ.

(2). සමාගමක් ප්‍රාග්ධනය රැස්කරන්නේ ............................................................. නිකුත් කිරීම මගිනි.

(3). යම් දේපළක් මිලදීගත් මුදලට වඩා වැඩි මිලට විකිණීමෙන් ............................................. ඉපයිය හැක.

(4). කොළඹ කොටස් වෙළෙඳපොළ ගනුදෙනු මෙහෙයවනු ලබන්නේ ........................................................... මගින්ය.

(5). රජය වෙනුවෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලබන්නේ ............................................................. විසිනි.

(ල.10)

03. පහත ප්‍රකාශවල සත්‍ය අසත්‍ය බව ලියා දක්වන්න.

(1). භාණ්ඩාගාර බිල්පත්, රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීමට නිකුත් කරන සුරැකුම්පත් වර්ගයකි. ...................................

(2). කොටස් මිලදී ගැනීම නිසා එහි ප්‍රතිලාභය ලෙස පොළී ආදායමක් හිමි වේ. .........................................

(3). දේපළක්, ණය මුදලක් ලබා ගැනීමේදී ඇප සුරැකුමක් ලෙස ඉදිරිපත් කළ හැකිය. ..............................

(4). මිලදීගත් කොටස් අවශ්‍ය වූ විටෙකදී නැවත විකිණිය හැක. ......................................

(ල.02)

04. (1). ''ආයෝජනය'' යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.02)

(2). සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක දෙකක් ලියන්න. (ල.02)

05. ආයෝජන මාර්ගයක් වශයෙන් කොටස් මිලදී ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ 02 ක් ලියන්න. (ල.02)

06. ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ කුමක්ද? (ල.01)

07. නිහාල් කුමාරසිංහ මහතා හට රු. 1 000 000 ක මුදලක් තම අර්ථසාධක අරමුදලින් ලද අතර ඉදිරි වසරේදී එම මුදලින් ඔහු දඹදිව වන්දනාවේ යෑමට අදහස් කරයි. එතෙක් පූර්ණ රාජ්‍ය ආරක්ෂාවක් ලැබෙන ලෙසත්, නිශ්චිත ප්‍රතිලාභයක් ලැබෙන ලෙසත් කෙටි කාලීන ආයෝජන මාර්ගයක එම මුදල් ආයෝජනය කිරීමට ඔහු තීරණය කරන ලදී.

ඉහත සිදුවීම ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1). නිහාල් කුමාරසිංහ මහතාගේ අර්ථසාධක අරමුදල ආයෝජනය කිරීමට වඩාත් සුදුසු ආයෝජන මාර්ගයක් යෝජනා කරන්න. (ල.02)

(2). එම ආයෝජන මාර්ගය තෝරා ගැනීමට හේතු වූ කරුණු දෙකක් ලියා දක්වන්නත. (ල.02)

*සැකසුම : ඩී.එස්. චේතනා මිය*